## උපුටනය (Abstract)

ඵලදායිතා සංකල්පය නූතන ලෝකයේ වඩාත් ජනප්‍රියත්වයට පත්වෙමින් තිබේ. මානව ජීවිතය විෂයෙහි එහි අදාළත්වය හා සමීප බව ඊට හේතු වන්නට ඇත. සීමිත සම්පත් තුළින් අසීමිත ප්‍රතිඵල ලබා ගැනීමේ අදහසත් කාල කළමනාකරණය කිරීමේ වැදගත් කමත් ලෝකයේ දිනෙන් දින වර්ධනය වන ප්‍රවණතාවන් ය. මෑත කාලයේ දක්නට ලැබෙන නවතම ප්‍රවණතාව ප්‍රබුද්ධ අදහස් සොයා පෞරාණික ප්‍රඥාව ගවේෂණය යි. මානව කේන්ද්‍රීය ආගමක් වන බුදුදහමෙහි අන්තර්ගත ඵලදායිතා ඥාණය නූතන ඵලදායිතා සංකල්පයට වඩා වැඩි යමක් දක්වනු ඇතැයි යන්න අපගේ විශ්වාසය යි. බෞද්ධ ඵලදායිතා සංකල්පයෙහි ඇතුළත් භෞතික ඵලදායිතාව, ආකල්පමය ඵලදායිතාව, සමාජමය ඵලදායිතාව හා එකතු කළ අගය සංකල්පය විෂයෙහි බෞද්ධ මූලාශ්‍රය ඇසුරෙන් මෙන්ම, බෞද්ධ සංස්කෘතික ඉතිහාසය තුළින් ද ඉගෙන ගත යුතු දේ බොහෝ ය.

ඵලදායිතා සංකල්පය පිළිබඳ ව අධ්‍යයනය කරන්නෙකුට බෞද්ධ සංඝ සමාජය උත්කෘෂ්ට ආදර්ශයක් සපයයි. බුදුරජාණන් වහන්සේ සංඝයා සංවිධානය කර ඇත්තේ උදාර පරමාර්ථයන් වෙනුවෙන් කැප වූ අතිශය ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ආධ්‍යාත්මික වශයෙන් සන්නද්ධ සමඟි සම්පන්න ව වාසය කරන පිරිසක් වශයෙනි. නූතන ඵලදායිතා සංකල්පයට සමගාමී වඩාත් ප්‍රබුද්ධ වූ ශික්ෂිත ප්‍රජාවක් හා උත්කෘෂ්ට ජීවන දර්ශනයක් විනය පිටකයෙන් හඳුනාගත හැකිය.

භෞතික සම්පත් පරිභෝජනයේ දී භික්ෂූහු සමතුලිත පිළිවෙතක් අනුගමනය කළහ. අනවශ්‍ය ලෙස සම්පත් නාස්ති නො කරමින් ඒවා උපරිම ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමෙන් ඉපැරණි ම සම්පත් සංරක්ෂකයන් බව ප්‍රකට කළහ. එසේ ම ගරු භාණ්ඩ වශයෙන් භික්ෂූන් වහන්සේලාට ලැබෙන භාණ්ඩ බොහෝ දෙනාගේ ප්‍රයෝජනය සඳහා වගකීමකින් යුතුව ආරක්ෂා කළහ. වෘක්ෂලතා, ජලය ආදී ස්වාභාවික සම්පත් ආරක්ෂා කර ගැනීමෙහි ලා දක්වා ඇති උනන්දුව ද ප්‍රශංසනීය ය. බෞද්ධ ප්‍රතිපත්තීන්ට අනුකූලව හැඩ ගැසුණු සමාජය එබඳු ප්‍රබුද්ධ සංරක්ෂණ ප්‍රතිපත්තීන් පිළිබඳ සජීවී නිදර්ශනයන් ය. බුදුසමයෙහි ඉගැන්වෙන ඵලදායිතා සංකල්පය ඉතා පෘථුල වූවකි. සූත්‍ර, විනය පිටකද්වය පුරා ම එය ව්‍යාප්තව පවතී. මෙම විෂය ක්ෂේත්‍රයේ පුළුල් පරාසය අවම කර ගැනීම සඳහා ඵලදායිතා සංකල්පයෙහි සඳහන් එස් පහ ශිල්පීය න්‍යාය පමණක් මෙම පර්යේෂණයට තෝරා ගත් අතර, එය ද විනය පිටක ඛන්ධක ඇසුරෙන් පරීක්ෂා කර බැලීමි.

මෙහි පළමු පරිච්ඡේදයේ දී ඛන්ධක පිළිබඳවත් නූතන එලදායිතා සංකල්පය හා එහි ආරම්භය පිළිබඳ ඉතිහාසයත් සැකෙවින් විස්තර කෙරිණි. ආර්ථික කළමනාකරණ ප්‍රවේශය පදනම් කොටගෙන එලදායිතා සංකල්පය බිහි වූ බවට විද්වතුන් දක්වන අදහස් එහි දී ඉදිරිපත් කොට ඇත.

දෙවැනි පරිච්ඡේදයේ දී බෞද්ධ විනය පිටකයට අයත් චුල්ලවග්ගපාළි සහ මහාවග්ගපාළි යන ඛන්ධක ග්‍රන්ථයන්හි දක්නට ලැබෙන එලදායිතා සංකල්ප සාකච්ඡා කෙරිණි. නූතන එලදායිතා සංකල්පයෙහි දක්නට ඇති භෞතික එලදායිතාව, ආකල්පමය එලදායිතාව, හරිත එලදායිතාව, සමාජමය එලදායිතාව හා එකතු කළ අගය නම් සංකල්පය ඛන්ධකයන්හි ප්‍රකට වී ඇති අයුරු යම් යම් සිද්ධි ගෙනහැර දක්වමින් විස්තර කර ඇත. නූතන එලදායිතා සංකල්පය භෞතික දියුණුව ම අරමුණු කොට ගෙන ක්‍රියාත්මක වුවද බෞද්ධ එලදායිතා සංකල්පය භෞතික සංවර්ධනය ඉක්මවා ගිය ආධ්‍යාත්මික සංවර්ධනය ද පදනම් කොට ගත්තක් බව එම සිද්ධි ඇසුරෙන් ප්‍රකට කර ඇත.

තෙවැනි පරිච්ඡේදයේ දී නූතන එලදායිතා සංකල්පයෙහි ප්‍රකට වන ශිල්පීය ක්‍රම සවිස්තරාත්මක ව හඳුන්වා ඇත. එසේ සවිස්තරාත්මක ව දැක්වීමෙන් අපේක්ෂා කළේ මෙම ශිල්පීය ක්‍රම විනය ඛන්ධක තුළ කෙතරම් පැහැදිලි ව ඉදිරිපත් කොට තිබේ ද යන්නට ප්‍රවේශයක් සකස් කිරීම යි. මෙහි දී එස් පහ සංකල්පය පිළිබඳ වැඩි අවධානයක් යොමු කෙරිණි.

සිවුවැනි පරිච්ඡේදයේ දී විනය ඛන්ධකවල එස් පහ සංකල්පය ක්‍රියාත්මක වී ඇති අයුරු අවස්ථා සහ සිද්ධි පදනම් කොට ගනිමින් විස්තර කර ඇත. නූතන එලදායිතා සංකල්පයන්හි දක්නට ලැබෙන පරිදි සමාජ සංවර්ධනය ම අරමුණු කොට එස් පහ සංකල්පය ඛන්ධකවල ක්‍රියාත්මක වී නොමැති බවත් සමාජ සංවර්ධනය සේ ම පුද්ගල සංවර්ධනය ද එක ලෙස සලකා ඇති බවත් මෙමගින් පෙන්වා දී ඇත.

පංචවිධ සංකල්පයෙහි අන්තර්ගත කරුණු බෞද්ධ දාර්ශනික පදනමක පිහිටා සකස් වී ඇත. ඒ අනුව එස් පහ යනු නව සොයා ගැනීමක් නොව ලෞකික සහ ලෝකෝත්තර සංවර්ධනය සඳහා බුදුදහම තුළ පෙන්වා ඇති ප්‍රායෝගික පිළිවෙතක් බව සමාලෝචනයෙන් ඉදිරිපත් කොට ඇත.